[භික්ඛු:]

අද්ධා මං යක්ඛ ජානාසි අථො මං[1] අනුකම්පසි,
පුනපි යක්ඛ වජ්ජාසි යදා පස්සසි එදිසන්ති.[2]

[දෙවතා:]

නෙව තං උපජීවාම[3] න පි තෙ භතකාම්හසෙ[4],
ත්වමෙව භික්ඛු ජානෙය්‍ය යෙන ගච්ඡෙය්‍ය සුග්ගතින්ති.

අථ ඛො සො භික්ඛු තාය දෙවතාය සංවෙජිතො සංවෙගමාපාදීති.

**වනවග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

විවෙකං[5] උපට්ඨානඤ්ච කස්සපගොත්තෙන[6] සම්බහුලා
ආනන්දො අනුරුද්ධඤ්ච නාගදත්තඤ්ච කුලඝරණී

වජ්ජිපුත්තො ච[7] වෙසාලී සජ්ඣායෙන[8] අයොනිසො
මජ්ඣන්තිකාලම්හි පාකතින්ද්‍රියා පදුම්පුප්ඵෙන චුද්දස භවෙති.

**වනසංයුත්තං සමත්තං.**

---

# 10. යක්ඛසංයුත්තං

## 1. ඉන්දකවග්ගො

### 10. 1. 1.

### ඉන්දකසුත්තං.

235. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ඉන්දකූටෙ** පබ්බතෙ **ඉන්දකස්ස** යක්ඛස්ස භවනෙ. අථ ඛො ඉන්දකො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

රූපං න ජීවන්ති වදන්ති බුද්ධා කථං න්වයං වින්දති'මං සරීරං,
කුතස්ස අට්ඨී යකපිණ්ඩමෙති කථං න්වයං සජ්ජති ගබ්භරස්මින්ති.

[භගවා:]

පඨමං කලලං හොති කලලා හොති අබ්බුදං,
අබ්බුදා ජායතෙ පෙසී පෙසී නිබ්බත්තති ඝනො,
ඝනා පසාඛා ජායන්ති කෙසා ලොමා නඛා'පි ච.

යඤ්චස්ස භුඤ්ජතෙ[9] මාතා අන්නං පානඤ්ච භොජනං,
තෙන සො තත්ථ යාපෙති මාතුකුච්ඡිගතො නරොති.

---

1. මෙ - මජ්ඣසං. 2 එදිසං - සීමු. PTS 3. උපජීවාමි - සීමු. PTS. 4. භතකම්හසෙ - සීමු - භදන්තම්හසෙ - සසා, ඝාතකම්හසෙ - PTS 5. විවෙකාඋපට්ඨානඤ්ච - PTS, සසා. 6. ගොත්තෙන ච - PTS. 7. ච ඉති නත්ථි, PTS. 8. සජ්ඣායෙන ච - PTS. 9. භුඤ්ජති - මජ්ඣසං, සසා.

Free Distribution www.aathaapi.org

[භික්‍ෂු:]

යක්‍ෂය, මා ඒකාන්තයෙන් පිරිසිදු ය යි දන්නෙහි ය. මට අනුකම්පා කෙරෙහි. යම් කලෙක මෙබන්දක් දක්නෙහි නම් යක්‍ෂය, නැවතත් කියන්නෙහි ය.

[දෙවි:]

මහණ, තොප නිසා නො ම ජීවත් වම්හ. තොපගේ බැලුයමෝ නො ද වම්හ. යම් කර්‍මයෙකින් සුගතියට යන්නේ ද, (එය) තො ම දන්නෙහි ය.

ඉක්බිති ඒ මහණ තෙමේ ඒ දේවතාවා විසින් සංවේගයට පමුණුවන ලද්දේ සංවේගයට පැමිණියේ ය.

**වනවර්‍ගය පළමුවැනි යි.**

**එහි උද්දානය:**

විවෙක, උපට්ඨාන, කස්සපගොත්ත, සම්බහුලා, ආනන්ද, අනුරුද්ධ, නාගදත්ත, කුලඝරණී, වජ්ජිපුත්ත, සජ්ඣාය, අයොනිසො, මජ්ඣන්තික, පාකතින්ද්‍රිය, පදුමපුප්ඵ යයි සූත්‍ර තුදුසෙකි.

**වනසංයුත්තය නිමියේ ය.**

---

# 10. යක්ඛසංයුත්තය

## 1. ඉන්දක වර්‍ගය

### 10. 1. 1.

### ඉන්දකසූත්‍රය.

235. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **ඉන්දකූට** පර්‍වතයෙහි **ඉන්දක** යක්‍ෂයාගේ භවනයෙහි වැඩ වසන සේක. එකල ඉන්දක යක්‍ෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී ය.

බුදුවරයෝ රූපය ජීවය යි නොකියත්. (එසේ නම්) මේ සත්ත්ව තෙමේ මේ සිරුර කෙසේ නම් ලබා ද? මොහුගේ ඇට හා අක්මාපිඩ කොයින් ඒ ද? මේ තෙමේ කෙසේ නම් මවුකුස ලැගේ ද?

[භගවත්හු:]

පළමු කොට කලලරූපය වේ. කලලයෙන් අබ්බුදය වේ. අබ්බුදයෙන් පේසිය හට ගණී. පේසියෙන් ඝන නම් මස්පිඩෙක් හට ගණී. ඒ ඝනයෙන් පිලක පසෙක් හට ගණී. ඉන් පසු කෙස් ද ලොම් ද නිය ද හට ගණිත්.

ඔහුගේ මව යම් අහරකුත්, බොන දියකුත්, බොජුනකුත් වළඳා ද, මවුකුසට පැමිණි ඒ සත්ත්ව තෙමේ ඒ ආහාර පානාදියෙන් එහි දී යැපේ.